| | | |
|---|---|---|
| **මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය** | | |
| **දෙවන වාර පරීක්ෂණය - 2018** | | |
| **නර්තනය** | **06 ශ්‍රේණිය** | **කාලය පැය දෙකකි** |

**නම: ..............................................................**

## I කොටස

- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1) ඔබ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායෙහි මූලික අංගහාර වන්නේ,

i. නමස්කාරයයි. ii. පා සරඹයයි.

iii. මණ්ඩියයි. iv. අත් සරඹයයි.

2) සැහැල්ලු බව, සරලබව, නම්‍යශීලි බව, සමබරතාවය යන මේවා,

i. සරඹ අභ්‍යාස වේ. ii. නම්‍යතා අභ්‍යාස වේ.

iii. නර්තනයේ මූලික ඉරියව්ව වේ. iv. අත් සරඹ වේ.

3) නැළවිලි ගායනයක ගී පාදයකි.

i. නීල වරල කුසුමන් ගවසාලා.

ii. උදයට පායන හිරු දෙවියන්ටයි.

iii. එක උස ඇති සදෙනෙක් තෝරා ගෙන.

iv. අතට වෙරළු ඇහිඳ ගෙනේ.

4) ''හිරු දෙවියන් නැමදීම'' කුමන භක්තිකයන්ගේ චාරිත්‍රයක් ද?

i. හින්දු භක්තිකයන්ගේ ii. දමිල භක්තිකයන්ගේ

iii. ක්‍රිස්තියානි භක්තිකයන්ගේ iv. බෞද්ධ භක්තිකයන්ගේ.

5) තත් ජිත් තොං නං තා මෙය,

i. බෙර පදයකි. ii. කස්තිරමකි.

iii. රබන් පදයකි. iv. ගොඩ සරඹයකි

- **හරි නම් (V) ලකුණ ද, වැරදි නම් (X) ලකුණ ද වාක්‍ය අවසානයේ ඇති වරහන තුළ යොදන්න.**

6) වර්ණ හැඩතල චලන නාද පරිසරය තුළ දැකිය හැකිය. (  )

7) සරල බව හා සාමූහික බව ගැමි නැටුමක දැකිය නොහැකිය. (  )

8) තෛයි පොංගල් උත්සවය පැවැත්වෙන්නේ මාර්තු මාසයේ ය. (  )

9) වන්නම්, සාම්ප්‍රදායික නර්තන අංගයකි. (  )

10) මාත්‍රා 2 + 2 තාල රූපය සුළු තනි තිතට අයත් වේ. (  )

- **හිස් තැනට සුදුසු පිළිතුර සපයන්න.**

11) ''ඕවාද සිප්ප දානේන'' මෙය ............................................................. යයි.

12) කාන්තා ලාලිත්‍ය විදහා පාන ගැමි නැටුමකි. ..............................................................

13) ලී කෙළි නැටුමක අවස්ථාවක් කැටයම් කර ඇත්තේ ......................................................... දේවාලයේ ය.

14) උඩරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන ඇඳුම් කට්ටලය වන්නේ ......................................................... ය.

15) පහතරට බෙරය වාදනය කරන්නේ ........................................................................ සම්ප්‍රදායට ය.

- **ගැලපෙන පිළිතුර යා කරන්න.**

| | |
|---|---|
| 16) වෙසක් උත්සවය. | ටින් බෙරය. |
| 17) කෝලාට්ටම්. | බෙර පදයකි. |
| 18) විකල්ප වාද්‍ය භාණ්ඩයකි. | නැළවිලි ගීයකි. |
| 19) කුඳ ගත ගත දොං | ආගමික උත්සවයක්. |
| 20) ලොවේ පුතුන් බොහොම ඇතා | ද්‍රවිඩ ගැමි නැටුමකි, |

## II කොටස

- ඔබ කැමති ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.

1)

i. වෙසක් උත්සවය උත්කර්ශවත් අන්දමින් පවත්වනු රටවල් හතරක නම් ලියා දක්වන්න. (ල. 05)

ii. වෙසක් උත්සවය හා සබැඳි සැරසිලි දෙකක් හා සාරධර්ම දෙකක් ලියා දක්වන්න. (ල. 05)

2)

i. සිංහල ගැමි නැටුම් දෙකක් හා ද්‍රවිඩ ගැමි නැටුම් දෙකක් නම් කරන්න. (ල. 05)

ii. කළගෙඩි කවියක් හා ලී කෙළි කවියක් ලියා දක්වන්න. (ල. 05)

3) හනුමා වන්නමට අදාළ

i. බෙර පදය ලියන්න. (ල. 02)

ii. තානම හා එක් කවියක් ලියන්න (ල. 08)

4)

i. තෛපොංගල් උත්සවය පැවැත්වීමේ හේතු දෙකක් ලියන්න. (ල. 02)

ii. එම උත්සවය හා සබැඳි චාරිත්‍ර විස්තර කරන්න. (ල. 05)

iii. ඔබ කැමති කෝලම් රටාවක් චිත්‍රයට නගන්න. (ල. 03)

5)

i. නම්‍යතා අභ්‍යාස කිරීමේ වැදගත්කම පිළිබඳ අදහස් ඉදිරිපත් කරන්න. (ල. 05)

ii. එම අභ්‍යාසයන්හි නිරතවීමෙන් කායික හා මානසික ප්‍රබෝධයක් ලැබෙන ආකාරය විස්තර කරන්න. (ල. 05)